# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2416/43 - 2024 දෙසැම්බර් මස 27 වැනි සිකුරාදා - 2024.12.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.-බී. 5/2019

**2018 අංක 29 දරන ගුවන් ප්‍රවාහන පනත**

6 වන වගන්තිය යටතේ වූ නියමය

2018 අංක 29 දරන ගුවන් ප්‍රවාහන පනතේ 6 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය බිමල් නිරෝෂන් රත්නායක වන මා විසින්, මේ නියමය මගින් -

(අ) ඉහත කී වගන්තිය යටතේ සාදන ලද සහ 2021 ජනවාරි මස 22 වැනි දින අංක 2211/68 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද උපලේඛනය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරනු ලැබේ :-

"උපලේඛනය

| *අංකය* | *I වන තීරය*<br>*වගන්තිය* | | *II වන තීරය*<br>*වගකීම්වලට සීමාවන්*<br>*(විශේෂ ගැණුම් හිමිකම්)* |
|---|---|---|---|
| 1. | 21 වන වගන්තිය - | මගියකුගේ මිය යාම හෝ තුවාල සිදුවීමක් සම්බන්ධයෙන් | එක් එක් මගියා සඳහා 151,880 |
| 2. | 22 වන වගන්තිය - 1 වන ඡේදය | පුද්ගලයන් ප්‍රවාහනයේ දී ප්‍රමාදවීම් වලින් සිදුවිය හැකි හානි සම්බන්ධයෙන් | එක් එක් මගියා සඳහා 6,303 |
| 3. | 22 වන වගන්තිය - 2 වන ඡේදය | ගමන් බඩු ප්‍රවාහනයේ දී ඒවා විනාශ වීම, නැති වීම, හානි වීම හෝ ප්‍රමාද වීම සම්බන්ධයෙන් | එක් එක් මගියා සඳහා 1,519 |
| 4. | 22 වන වගන්තිය - 3 වන ඡේදය | බඩු ප්‍රවාහනයේ දී ඒවා විනාශ වීම, නැති වීම, හානි වීම හෝ ප්‍රමාද වීම සම්බන්ධයෙන් | කිලෝග්‍රෑම් එකක් සඳහා 26"; |

(ආ) ඉහත කී උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ප්‍රතිශෝධිත වගකීම් සීමාවන් බලාත්මක වන දිනය ලෙස 2024 දෙසැම්බර් මස 28 වන දිනය නියම කරනු ලැබේ.

බිමල් නිරෝෂන් රත්නායක,
ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය.

2024 දෙසැම්බර් මස 27 වැනි දින,
කොළඹ දී ය.

EOG 12 - 0279